# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 51 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 12/01/2024<br>පැය 1140 |

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මිනුවන්ගොඩ පොලිස් ස්ථානය.**

2024.01.11 වන දින සවස් කාලයේදී මිනුවන්ගොඩ පොලිස් වසමේ කොටුගොඩ ප්‍රදේශයේදී මිනුවන්ගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **කේරළ ගංජා කිලෝ ග්‍රෑම් 07 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වූ කොටුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මිනුවන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - යක්කල පොලිස් ස්ථානය.**

2024.01.11 වන දින සවස් කාලයේදී යක්කල පොලිස් වසමේ ඉහලයාගොඩ ප්‍රදේශයේදී යක්කල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 550 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වූ රාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

යක්කල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - හෝමාගම පොලිස් ස්ථානය.**

2024.01.11 වන දින සවස් කාලයේදී හෝමාගම පොලිස් වසමේ ඇඟළුම් කර්මාන්ත ශාලාව අසල මාර්ගයේදී හෝමාගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 450 ක්** සන්තකයේ තබාගෙන යතුරු පැදියකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වූ හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හෝමාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.01.11 වන දින දහවල් කාලයේදී ගැන්ඩිපාස් පොලිස් වසමේ නාගලගම්වීදිය ප්‍රදේශයේ දී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 950 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන නාගලගම්විදිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය මගින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කුරුණෑගල කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.**

2024.01.11 වන දින රාත්‍රී කාලයේ කුරුණෑගල පොලිස් වසමේ යන්තන්පලාව ප්‍රදේශයේදී කුරුණෑගල කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කුරුණෑගල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන යන්තම්පලාව, කුරුණෑගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කුරුණෑගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06. වන අලියෙකු පහරදීමෙන් පුද්ගලයෙකු මියයාම - සූරියවැව පොලිස් වසම**

2024.01.11 වන දින රාත්‍රී කාලයේ සූරියවැව පොලිස් වසමේ වැවේගම රක්ෂිත ප්‍රදේශයේදී වන අලියෙකු පහරදීම හේතුවෙන් පුද්ගලයෙකු මිය ගොස් ඇති බවට ලද තොරතුරක් මත සූරියැව පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

මරණකරු වයස අවුරුදු 38 ක්වූ බැද්දෙවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.

ගවයන් රැක බලා ගැනීමට රක්ෂිත ප්‍රදේශයට ගොස් සිටිය දී මෙම පුද්ගලයාට වන අලියෙකු පහර දී ඇති බව සූරිය වැල පොලිසිය සිදු කල විමර්ශන වලදී අනාවරණය වී ඇත. මෘත ශරිරය පශ්චාත් මරණ පරික්ෂණය සඳහා හම්බන්තොට රෝහලේ මෘත ශරිරාගාරයේ තන්පත් කර ඇත.

සූරියවැව පොලිස් ස්ථානය විසින් වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

## 07. මෘත ශරීරයක් හමුවීම - ගිනිගත්හේන පොලිස් වසම.

2024.01.11 වන දින උදෑසන කාලයේ ගිනිගත්හේන  පොලිස් වසමේ අල්ලිවත්ත ඇළ මාර්ගයක පිරිමි මළ සිරුරක් ඇති බවට ලද පණිවිඩයක් මත ගිනිගත්හේන පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

මියගිය පුද්ගලයා 2024.01.10 වන දින සිට ආගිය අතක් නොමැති බවට ගිනිගත්හේන  පොලිසිය වෙත පැමිණිල්ලක් ද ලැබී තිබූ අතර මරණකරු **වයස අවුරුදු 30 ක් වන  කෙනිල්වත්ත, ගිනිගත්හේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු පුරුද්දක් වශයෙන් නිවසට අවශ්‍ය දර කපාගෙන ඒම සඳහා නිවස ආසන්නයේ ඇති කැලෑ ප්‍රදේශයට පිටව ගොස් සිටිය දී මෙලෙස මිය ගොස් ඇත. මෘත ශරිරය පශ්චාත් මරණ පරික්ෂණය සඳහා නාවලපිටිය රෝහලේ මෘත ශරිරාගාරයේ තන්පත් කර ඇත. ගිනිගත්හේන පොලිස් ස්ථානය විසින් වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.